# දෙවන වාර පරීක්ෂණය

## ගණිතය

## 9 ශ්‍රේණිය

2018

කාලය : පැය 2 යි.

නම:- ..........................................................

### I කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1. පැන් 3 ක මිල රු. 45 කි. පෑන් දෙකක මිල සොයන්න.
2. 27.8 විද්‍යාත්මක අංකනයෙන් ලියන්න.
3. $a = \frac{2}{3}$ $b=2$ නම් $3a+b^2$ හි අගය සොයන්න.
4. $P = K + rt$ සූත්‍රයේ t උක්ත කරන්න.
5. 




x හි අගය සොයන්න.

6. 1101 දෙක යන්න 10 හි පාදයේ සංඛ්‍යාවක් ලෙස ලියන්න.
7. කවකටුව හා සරල දාරය භාවිතයෙන් $45^0$ ක කෝණයක් අඳා දක්වන්න.
8. ළමයෙකු දිනකට පැය $1\frac{3}{4}$ රූපවාහිනිය නරඹයි නම්, ඔහු සතියකට කොපමණ කාලයක් රූපවාහිනිය නරඹයි ද?
9. $\{x^2 \times y^2\}^0$ හි අගය සොයන්න.


To download past papers visit
www.vajirapani.blogspot.com


10. 




x හි y හි අගයන් සොයන්න.

11. රු. 200 000 ට ඉඩමක් විකිණීමේදී තැරැව්කරුවෙකු 2% ක කොමිස් මුදලක් ලබාගනියි. එම මුදල කොපමණ ද?
12. විෂ්කම්භය 42cm වන රෝදයක් සහිත වාහනයක් එම රෝදය වට 10ක් කරකැවීමේදී ගමන් කරන දුර කොපමණ ද?
13. 3.74 පළමු දශමස්ථානයට වටයන්න.

14. පොදු පදය 3n-4 වන සංඛ්‍යා රටාවේ 11 වන පදය සොයන්න.

15. $\frac{83}{1000}$ ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

16. A ගේ ස්කන්ධය 40kg කි. A හා B යන දෙදෙනාගේම ස්කන්ධවල එකතුව 75kg කි. A හා B ගේ ස්කන්ධ අතර අනුපාතය සරලම ආකාරයෙන් දක්වන්න.

17. $\frac{(-4)\times(-12)}{(+6)}$ සුළු කරන්න.

18. $(8.5)^2 - (1.5)^2$ අගය සාධක දැනුම භාවිතයෙන් සොයන්න.

19.




AB හා AC යනු ඉඩමක මායිම් දෙකකි. AB හා AC මායිම් වලට සමදුරින්ද, A සිට 5m දුරින්ද ජල කරාමයක් සවිකළ යුතුය. ඒ සඳහා සුදුසු ස්ථානය පථ දැනුම භාවිතයෙන් දළ සටහනක ඇඳ දක්වන්න

20.




To download past papers visit
www.vajirapani.blogspot.com

$x^0$ සොයන්න.

## II කොටස

ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.

(01) (a) පොත් වෙළෙන්දෙක් රු. 400 කට පොතක් මිලටගෙන 25% ලාභයක් අපේක්ෂාවෙන් එහි විකුණුම් මිල ලකුණු කළේය.

i. වෙළෙන්දා අපේක්ෂා කළ ලාභය කීය ද? (ල.2)

ii. පොත විකිණීමට ලකුණු කළ මිල කීය ද? එම පොත විකිණීමේදී 10% වට්ටමක් ලබාදෙයි. (ල.2)

iii. එම වට්ටම් මුදල කීය ද? (ල.2)

iv. පොත මිලදී ගත් කෙනෙකු ඒ සඳහා ගෙවිය යුතු මිල කීය ද?

(b) $3\frac{1}{2}, \div 1\frac{2}{3},$ න් $\frac{1}{5}$ සුළු කරන්න (ල.4)

(02) (a) නිමාලි තම කැටයට සෑම සතියකටම වරක් සිකුරාදා දින මුදල් දමන්නේ පහත රටාව අනුවය.

30, 40, 50, ......

i. එම සංඛ්‍යා රටාවේ පොදු පදය ලියන්න. (ල.2)

ii. ඇය රු. 140 ක් කැටයට දමන්නේ කී වැනි සතියේ ද? (ල.3)

(b) i. $4 + 2\{3(X + 2) - 2x\} = 25$ විසඳන්න. (ල.3)

ii. $3x + 2y = 16$

$x + 2y = 12$ යන සමගාමී සමීකරණය විසඳන්න

(03) (a) සාධක සොයන්න.

i. $x^2 + 6x + 8$ (ල.3)

ii. $2x^2 - 8y2$ (ල.3)

To download past papers visit
www.vajirapani.blogspot.com

(b) i. $(3x + 2)(x-3)$ (ල.3)

ii. $\frac{(a^3)^2 \times a^4 \times a^0}{a^3 \times a}$ දර්ශක නීති භාවිතයෙන් සුළු කරන්න. (ල.3)

(04) $y = 2x + 1$ මගින් සරල රේඛාවක සමීකරණයක් දැක්වේ.

i. එම සරල රේඛාවේ අනුක්‍රමණයත් අන්තඃඛණ්ඩයත් ලියන්න. (ල.2)

ඉහත සරල රේඛාවේ ප්‍රස්ථාරය ඇඳීමට සුදුසු අසම්පූර්ණ අගය වගුවක් පහත දැක්වේ.

| x | -2 | -1 | 0 | 1 | 2 |
|---|---|---|---|---|---|
| y | -3 | -1 | ..... | ..... | ..... |

ii. එම වගුවේ හිස්තැන් පුරවන්න. (ල.3)

iii. සුදුසු ඛණ්ඩාංක තලයක එම සරල රේඛාවේ ප්‍රස්ථාරය අඳින්න. (ල.4)

iv. ඉහත ඔබ ඇඳි සරල රේඛාව y අක්ෂය හරහා යන, ස්ථානයෙන්ම y අක්ෂර හරහා යන අනුක්‍රමණය -3 වූ, සරල රේඛාවේ සමීකරණය ලියන්න. (ල.3)

(05) රූපයේ දැක්වෙන්නේ එක්තරා බිම් කඩක දල රූපයකි. එහි ඇති අර්ධ වෘතාකාර කොටසේ අරය 7m කි. o යනු එහි කේන්ද්‍රයයි.

To download past papers visit
www.vajirapani.blogspot.com




i. AB දිග සොයන්න. (ල.2)

ii. AE දිග ගණනය කරන්න. ඔබ ඒ සඳහා යොදාගත් සම්බන්ධය කුමක් ද? (ල.3)

iii. CD අර්ධවෘත්ත චාපයේ දිග සොයන්න. (ල.3)

iv. ඉහත භූමියේ පරිමිතිය සොයන්න. (ල.2)

v. ADE ත්‍රිකෝණාකාර කොටස ද මෙම භූමියට එක් වුවහොත් මෙම භූමියේ වර්ගඵලය කොපමණ ප්‍රමාණයකින් වැඩිවේ ද? (ල.2

(06) (a) i. 8cm දිග AB සරල රේඛා ඛණ්ඩයක් නිර්මාණය කරන්න.
(ල.2)

ii. A සහ B ලක්ෂවලට සමදුරින් පිහිටි පථය නිර්මාණය කරන්න. (ල.2)

iii. AB බාහුවක් වනසේ A හිදී $60^0$ ක කෝණයක් නිර්මාණය කරන්න. එය ඉහත පථය හමුවන ලක්ෂය C ලෙස නම් කරන්න. (ල.2)

iv. AC දිග මැන ලියන්න.
(ල.1)

(b)




දී ඇති රූපයේ තොරතුරු ඇසුරෙන් පහත කොටස් සම්පූර්ණ කරන්න.

$E\hat{F}B = \cdots$ ............................ (.........) (ල.1)

$E\hat{F}I = \cdots$ ............................ (.........) (ල.1)

$E\hat{F}B + \cdots$ .................. $= \cdots$ ............ $+ \cdots$ ........... ( ............ ) (ල.2)

$\therefore I\hat{F}B = \cdots$ .................. (ල.1)